# මූලික තොරතුරු ලේඛනය
# ස්ථාවර තැන්පතු
# මර්චන්ට් බෑංක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී

**ප්‍රධාන ලක්ෂණ හා ප්‍රතිලාභ**

අ) ආකර්ශනීය පොළී අනුපාත.
ආ) පොලිය මාසිකව, වාර්ෂිකව හෝ කල් පිරෙන විට හෝ ලබා ගත හැක.
ඇ) තැන්පතු මුදලින් උපරිමය 80% දක්වා වූ ක්ෂණික ණය මුදලක්.
ඈ) උපරිම වශයෙන් රුපියල් 1,100,000.00 ක් තැම්පත් කළ මුදල මත පදනම් වූ තැම්පතු රක්ෂණ ආවරණය.

**පොළී අනුපාත සහ අනෙකුත් ගාස්තු**

අ) අදාළ පොළී අනුපාත දිවයින පුරා ඇති සෑම ශාඛාවකම සහ සමාගමේ වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කෙරේ. වෙළඳපළ තත්ත්වයන් මත පදනම්ව, අපගේ පොළී අනුපාත කලින් කලට සංශෝධනය කරනු ලැබේ.
ආ) ස්ථාවර තැන්පතු ආරම්භක ගාස්තු සහ නඩත්තු ගාස්තු නොමැත.
ඇ) ශේෂ තහවුරු කිරීමේ ගාස්තු - වීසා සම්බන්ධ කාර්යයන් වෙනුවෙන් ශේෂ තහවුරු කිරීම සඳහා එක් තහවුරුවකට රු. 1,000.00 ක ගාස්තුවක් අය කරනු ලැබේ.
ඈ) බදු / විගණන සම්බන්ධ තහවුරු කිරීම් සඳහා ගාස්තු අය කරනු නොලැබේ.

**මූලික නියමයන් හා කොන්දේසි**

**සුදුසුකම්**

අ) වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්.
ආ) නේවාසික වීසා හෝ ද්විත්ව පුරවැසිභාවය සහිත විදේශීය පුරවැසියන්.
ඇ) අනන්‍යතාවය තහවුරු කිරීමේ වලංගු ලේඛන (ජාතික හැඳුනුම්පත, ජාතික හැඳුනුම්පත් අංකය තිබේ නම්, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය පිළිගත හැක.)
ඈ) 2022 ඔක්තෝම්බර් මස 11 වන දින ප්‍රකාශයට පත් කරන ලද අනන්‍ය හඳුනාගැනීමේ අංකය සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රසිද්ධ දැනුම්දීම පරිදි ඉදිරිපත් කෙරෙන ඕනෑම වලංගු හැඳුනුම් ලේඛනයක් (ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය බලන්න.)
ඉ) අවම මූලික තැන්පතුව - රු. 5,000/-.

**අ) ගිණුමක් විවෘත කිරීම**

තම අවශ්‍යතා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස අප ප්‍රධාන කාර්යාලය වෙත හෝ ළඟම ඇති ශාඛාව වෙත පැමිණෙන ලෙස සියලුම අනාගත ගනුදෙනුකරුවන්ට ආරාධනා කරනු ලැබේ. එසේ කරනු ලබන සාකච්ඡාවෙන් පසු, අදාළ ගනුදෙනුකරුගේ අවශ්‍යතා මත පදනම්ව ඒ සම්බන්ධයෙන් කෙරෙන අගැයීමකින් ද පසුව මුදල් තැන්පත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වේ. එසේම, අපි අපගේ ගනුදෙනුකරුවන්ගේ නිවෙස් වෙතටම පැමිණ සේවා සැපයීමට ද සූදානමින් සිටින්නෙමු.

**ආ) අවශ්‍ය ලියකියවිලි**

අ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත.
ආ) ජාතික හැඳුනුම් පත් පිටපත.
ඇ) අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා බිල්පත්වල පිටපත්.
ඈ) නේවාසික වීසා සහිත විදේශීය තැන්පත්කරුවන් සඳහා ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍රය.

**ගිණුම අවසන් කර වසා දැමීම**

අ) පරිණත වූ තැන්පතු මුල් ස්ථාවර තැන්පතු සහතික ද සමඟ ඒවා කල්පිරීමට පෙර ලබා දී ඇති උපදෙස් අනුව එහි ගිණුම් අවසන් කර වසා දමනු ලැබේ.
ආ) තැන්පතුව ඊට අදාළ සහතිකයේ මුහුණතෙහි සඳහන් කාල සීමාව සඳහා ස්ථාවර වන අතර කලින් වසා දැමිය නොහැක.
ඇ) කෙසේ වෙතත්, තැම්පතුවක් කල් පිරීමට පෙර එහි මුදල් ආපසු ලබා ගැනීම කළමනාකාරීත්වයේ තනි අභිමතය පරිදි සලකා බැලිය හැකි ය. එබඳු මුදල් ආපසු ලබා ගැනීම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන්හි විධිවිධාන ප්‍රකාරව, අඩු කරන ලද පොළී අනුපාතයකට යටත්ව හෝ සාමාන්‍ය ඉතුරුම් අනුපාතයට 2% ක වැඩිපුර පොළී ප්‍රතිශතයක් එකතු කර ගෙවීම් කරනු ලැබේ.

**නීතිමය විධිවිධාන**

මීට අදාළ නීතිමය ප්‍රතිපාදන පහත දැක්වේ.
අ) ගිවිසුම් නීතිය,
ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියමයන් සහ චක්‍රලේඛ.

පැමිණිලි හැසිරවීමේ පටිපාටිය
ගනුදෙනුකරුවන්ට අපගේ සේවා සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය;

අ) ළඟම ඇති ශාඛාව වෙත ගොස් ශාඛා කළමනාකරු වෙත පැමිණිල්ල ඉදිරිපත් කිරීම
ආ) අපගේ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය 011 - 4 711 711 හරහා හෝ විද්‍යුත් තැපෑලෙන් - info@mbslbank.com / customercare@mbslbank.com හරහා පැමිණිලි කරන්න.
ඇ) තැපෑලෙන් - ලිඛිතව පැමිණිල්ලක් කිරීම ;

සහකාර සාමාන්‍යාධිකාරී,
අලෙවිකරණ සහ ප්‍රවර්ධන අංශය,
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල් .සී,
අංක. 28, BOC මර්චන්ට් කුළුණ,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

**"සැක සහිත ගණුදෙණු සහ නියමිත සීමාවෙන් ඉහල ගනුදෙනු (මිලියන 1 ට වැඩි) මූල්‍ය බුද්ධි අංශයට වාර්තා කෙරේ"**